# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2016/37 - 2017 අප්‍රේල් මස 26 වැනි බදාදා - 2017.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (I) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ නියමයන්ට අනුකූලව පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1955/22 හා 2016.02.25 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත, අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති උපලේඛනයෙහි I කොටසෙහි, අංක 15 හා 16 යටතේ සඳහන් බලතල පැවරීම පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර අංක 14 (ඇ) හා 19 යටතේ නව විධිවිධාන ඇතුළත් කරමින් එම උපලේඛනයේ I කොටස 2017.04.26 දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

02.

| *I වන තීරුව*<br>*නිලධාරී ගණය* | *II වන තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III වන තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 14. (ඇ) අතිරේක දිස්ත්‍රික් ලේකම් | 01. ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. තනතුරට පත් කිරීම |
| 15. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරීන් | 01. ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පටිපාටිවලට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදවල් පිළිබඳ විනය පාලනය. |
| | 02. අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපති | I. වැඩ බැලීමට පත් කිරීමට අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම |

| *I වන තීරුව*<br>*නිලධාරී ගණය* | *II වන තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III වන තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 16. ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ අධි පන්තියට පහළ නිලධාරීන් | 01. ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයා-ගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථාවලට අනුකූලව පත් කිරීම<br>II. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| | 02. ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා වලට අනුකූලව III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා වලට අනුකූලව II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටි වලට අනුකූලව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීම |
| | 03. අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපති | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටි වලට අනුකූලව දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කිරීම<br>II.සේවයෙන් පහ කිරීම හැර විනය පාලනය<br>III. කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයෙහි යෙදවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම<br>IV. වැඩ බැලීමට පත් කිරීම |
| | 04. අදාළ ප්‍රාදේශීය ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටි වලට අනුව ප්‍රාදේශීය ලේකම්ගේ බල ප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම |
| 19. සංචාරක බංගලා භාරකරුවන් සහ පන්තියට පහළ නිලධාරීන් සහායක සංචාරක බංගලා භාරකරුවන් | 01. ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයා-ගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා වලට අනුකූලව පත් කිරීම<br>II. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම |
| | 02. ස්වදේශ කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා වලට අනුකූලව III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි/සේවා ව්‍යවස්ථා වලට අනුකූලව II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම. |
| | 03. අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපති | I. සේවයෙන් පහ කිරීම හැර විනය පාලනය |

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 1941/41 හා 2015.11.20 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 අප්‍රේල් මස 25 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

05 - 320

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.